සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

නම/විභාග අංකය :- ........................................................................................ කාලය : පැය 01 යි.

- පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් ඇසුරෙන් 1-4 ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

A. මව්පියෝ නිදහස් වන්නට - මාව දුන්නයි නාකි වූ හමෙකුටා
උන්දැල හට කඹුරන්නට - යැද ඉන්නෙ සුරන් හට දෙස්කොටා

B. වඩිග පුර දේසෙන් - සත්දෙන බමුණු ඇවිදින්
කළ වඩිග පටුනින් - මෙසේ බමුණෝ යාග කරමින්

C. යක්දෙස්සා - මේකට මොකද මේ?
බෙරකරු - මම නොකිව්වට මුට කිරිපණු ගාය
යක්දෙස්සා - අනේ බොලන් මේ කවුද?
බෙරකරු - මූ වැද්දා .......

D. වලට ගොස් ම පියාණෙනි උතුම්
කිසි දිනක පෙරළා නොආවොත්
මේ ලෙනේ සිර වී සිටින්නා
බැහැර යන්නට මග නොදන්නා

(1) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා 1961 දී නිර්මාණය කළ නාට්‍යයක ගීත කොටසකි.
(i) A (ii) B (iii) C (iv) D

(2) පහතරට වෙරළ කලාපයේ ප්‍රචලිත ගැමි නාට්‍යයක් හා සම්බන්ධ වේ.
(i) A (ii) B (iii) C (iv) D

(3) "මැණික්පාල" දේවියට වැළඳි රෝගය නිවාරණය කිරීම උදෙසා සිදු කළ යාගයේ එන ගායනා කොටසක් වන්නේ
(i) A (ii) B (iii) C (iv) D

(4) "C" හි අඩංගු සංවාදය හා වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
(i) සූනියම් යාගය හා සම්බන්ධ සංවාදයකි.
(ii) රට යකුම් යාගයේ යොදාගන්නා සංවාදයකි.
(iii) කොහොඹා යක් කංකාරියේ යොදාගන්නා සංවාදයකි.
(iv) සොකරි ගැමි නාට්‍යයේ යෙදෙන සංවාදයකි.

(5) නෘත්ත යනු,
(i) භාව ප්‍රකාශනයෙන් තොර නර්තනයකි.
(ii) බටහිර නිර්මාණය වූ සංකල්පයකි.
(iii) මෙය මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ ඇරිස්ටෝටල් ය.
(iv) කථක් නර්තනයට අයත්ය.

(6) ප්‍රාසාංගික කලාවන් පමණක් අයත් වනුයේ,
(i) චිත්‍ර, මූර්ති, නාට්‍ය (ii) නාට්‍ය, ඔපෙරා, චිත්‍රපට
(iii) චිත්‍රපට, ටෙලිනාට්‍ය, වේදිකා නාට්‍ය (iv) ඔපෙරා, බැලේ, මුද්‍රා නාට්‍ය

(7) ඕනෑම රංග භූමියක් සම්බන්ධයෙන් නිවැරදි නොවන්නේ,
(i) වේදිකාව මනඃකල්පිත කොටස් 9 බෙදා තිබීම. (ii) රංගනයට ප්‍රමාණවත් අවකාශයක් තිබීම.
(iii) ප්‍රේක්ෂකයන්ට පහසුවෙන් නැරඹිය හැකි වීම. (iv) රංග භූමිය සමතලා ප්‍රදේශයක වීම.



5382

(8) නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී නාට්‍ය යුගලය පිළිවෙලින් අයත් වන්නේ,
(i) සිංහබාහු, දික්තල කාලගෝල (ii) ජනේලය, දික්තල කාලගෝල
(iii) මහාසාර, මනමේ (iv) සිංහබාහු, තලමල පිපිලා

(9) වේදිකා නාට්‍යයක් රංගගත අවස්ථාවේ සිටිය යුතුම ශිල්පීන් අයත් පිළිතුර වන්නේ,
(i) නළු නිළියන්, නාට්‍ය අධ්‍යක්ෂ, වේදිකා පාලක, පෙළ මතක් කරන්නන්.
(ii) නාට්‍ය අධ්‍යක්ෂ, පිටපත් රචක, වේදිකා පාලක, නළු නිළියන්
(iii) නළු නිළියන්, වේදිකා පාලක, පෙළ මතක් කරන්නන්, රංගාලෝක ශිල්පියා.
(iv) රංගාලෝක ශිල්පියා, සංගීත නිර්මාණ ශිල්පියා, නාට්‍ය අධ්‍යක්ෂ, රංග වින්‍යාස ශිල්පියා

(10) රංගාලෝකයේදී භාවිතා වන පහන් පමණක් අයත් වරණය වන්නේ,
(i) ධාරාලෝක පහන, ස්ට්‍රිප් පහන, මිරර් බෝල (ii) ඩිමරය, ස්ට්‍රිප් පහන, යොමු පහන
(iii) යොමු පහන, ස්ට්‍රිප් පහන, මිරර් බෝල (iv) ධාරාලෝක පහන, ස්ට්‍රොබ් පහන, යොමු පහන

(11) නොගැලපෙන යුගලය තෝරන්න.
(i) ලප නොමවන් සඳ සේ ..... - මනමේ නාට්‍යය (ii) සත්සියක් කපු මල් රැගෙන.... - කුවේණි නාට්‍යය
(iii) සෝබාවදේ මෙපුර .... - තාරාවෝ ඉගිලෙති (iv) හනික වරෙව් කොල්ලනේ ... - සෙක්කුව

(12) නාට්‍ය ගීතයක් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(i) නාට්‍ය ගීතය රංග පරම විය යුතුය.
(ii) නාට්‍ය ගීත ඒ ඒ නාට්‍ය ශෛලීන් අනුව වෙනස් වේ.
(iii) නාට්‍ය ගීතය ශ්‍රව්‍ය දෘශ්‍ය ව රස විඳිය හැකිය.
(iv) ලෝක ධර්මී නාට්‍ය සඳහා නාට්‍ය ගීත අනිවාර්යය වේ.

(13) වේෂභූෂණ සම්බන්ධයෙන් නොගැලපෙන වරණය තෝරන්න.
(i) වේෂභූෂණ අභ්‍යන්තර හා බාහිර සමාරෝපයට ඉතා වැදගත් ය.
(ii) ප්‍රේක්ෂකයාට චරිතය හඳුනාගැනීමට මෙය උපකාරී වේ.
(iii) අංග රචනා ශිල්පියා විසින් වේෂභූෂණ නිර්මාණය කරයි.
(iv) වේෂභූෂණ නිර්මාණයේදී නාට්‍යයේ ශෛලිය පිළිබඳව සැලකිය යුතුය.

(14) වේදිකා නාට්‍ය හා සම්බන්ධ ආනුෂාංගික ශිල්පියෙකු නොවන්නේ,
(i) සංගීත නිර්මාණ ශිල්පියා. (ii) පෙළ රචනා ශිල්පියා.
(iii) රංගාලෝක නිර්මාණ ශිල්පියා. (iv) අංග රචනා ශිල්පියා.

(15) රංග භූමි අලංකරණ සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(i) සෑම නාට්‍යයක් සඳහාම රංග භූමි අලංකරණ අත්‍යවශ්‍යවේ.
(ii) ජීවමාන නළු නිළියන් යොදා ගැනීමෙන් ද රංග භූමි අලංකරණ සිදු කරයි.
(iii) පරිහරණයේ පහසුව, ඉක්මනින් ගැලවීම, සවිකිරීම ආදිය සලකා රංග පසුතල නිර්මාණය කළ යුතුය.
(iv) නළු කාර්යය ඉස්මතු වන ලෙස රූපණ රටාවට ගැළපෙන ලෙසත් රංග භූමි අලංකරණ සිදු කළ යුතුය.

- **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් 16 - 19 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| සෙක්කුව | මරාසාද් | පුස්ලෝඩං | අහස් මාලිගා |
| උත්තමාවී | ඇසළ සඳ අවන්හල | පණ්ඩුකාභය | මකරා |
| වරෙන්තු | දුන්න දුනු ගව්වේ | සුභ සහ යස | .................... |
| ගැලීලියෝ | හරිම බඩු හයක් | සුදු සහ කළු | කුවේණි |

(16) පරාක්‍රම කිරිඇල්ල නාට්‍ය නිර්මාණ අයත් වන්නේ,
(i) A (ii) B (iii) C (iv) D

(17) "D" වගුවේ හිස්තැන් සඳහා වඩාත් උචිත නාට්‍ය වනුයේ
(i) තට්ටු ගෙවල් (ii) බෙරහඬ (iii) ජනේලය (iv) සකල ජන

(18) "C" වගුවේ නාට්‍ය රචනා කරන ලද නාට්‍යකරුවා
(i) සයිමන් නවගත්තේගම (ii) හෙන්රි ජයසේන
(iii) බන්දුල ජයවර්ධන (iv) සුගතපාල ද සිල්වා

(19) ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් අයත් කාණ්ඩය වනුයේ,
(i) A (ii) B (iii) C (iv) D

(20) හිම කන්ද දියවීමේ රංග අභ්‍යාසය අයත් වන්නේ
(i) සංවේදන අභ්‍යාස (ii) ශිථිලකරණ අභ්‍යාස
(iii) ශ්වසන අභ්‍යාස (iv) දර්පණ අභ්‍යාස

(21) ඔබේ නාට්‍ය ගුරුවරයා ඔබට දෑස් වසාගන්නට උපදෙස් ලබා දී විවිධ ශබ්ද ශ්‍රවණය කිරීමට සලස්වා ඒවා හඳුනාගන්නට පවසයි. මෙය
(i) සංවිදන අභ්‍යාසයක් ය. (ii) ශ්වසන අභ්‍යාසයක් ය.
(iii) ශිථිලකරන අභ්‍යාසයක් ය. (iv) කටහඬ අභ්‍යාසයක් ය.

(22) "අභිරූපණ රංගනය" හා නොගැළපෙන පිළිතුර වන්නේ
(i) ආංගික අභිනය මූලික කරගෙන නිර්මාණශීලීව රඟ දක්වන්නකි.
(ii) සාත්වික අභිනයද රංගනයේදී යොදාගනී.
(iii) රංග භාණ්ඩ අවශ්‍ය පරිදි යොදාගනියි.
(iv) සැහැල්ලු ගමන, පැති ගමන, ආපසු ගමන ආදී ගමන් රටා.

(23) වේදිකා නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයා හා නොගැලපෙන්නේ
(i) නාට්‍ය රසිකයකු වෙයි. (ii) නාට්‍ය විචාරකයකු වෙයි.
(iii) නාට්‍ය විනිශ්චයකරුවෙකි. (iv) ප්‍රේක්ෂකයා නැතිනම් නාට්‍යක් නැත

(24) සන්නි යකුම් යාගයේ වාද්‍ය භාණ්ඩයකි.
(i) රුහුණු බෙරය (ii) ගැටබෙරය (iii) තම්මැට්ටම (iv) දවුල

(25) දකුණු ඉන්දිය තෙරුක්කුත්තු නාට්‍ය ආභාෂය ලද මෙරට නාට්‍ය විශේෂය
(i) නාඩගම් (ii) සොකරි (iii) කෝලම් (iv) නූර්ති

(26) කෝලම් ගැමි නාට්‍යයේ ඉදිරිපත් වන පාත්‍රයකු අඩංගු නොවන කාණ්ඩය වනුයේ
(i) නොංචි අක්කා, ආරච්චි, ලෙංචිනා (ii) ලෙංචිනා, මුදලි, පණික්කිලයා
(iii) ජසයා, ලෙංචිනා, සොකරි (iv) පොලිස්, මුදලි, ආරච්චි

(27) ශ්‍රී ලංකාවේ මුල්ම නූර්තිකරුවා වන්නේ
(i) ජෝන් ද සිල්වා (ii) සී. දොන් බස්තියන් (iii) චාල්ස් ඩයස් (iv) පිලිප්පුසිඤ්ඤෝ

- **28 සිට 31 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව භාවිතා කරන්න.**

| P | Q | R | S |
|---|---|---|---|
| වලහා<br>වෙද හටන<br>යන්තම් ගැලවුණා<br>ඉබේ වෙදා | එලොව ගිහින් මෙලොව ආවා<br>හස්තිකාන්ත මන්තරේ<br>කදා වළලු<br>ඒකට මට හිනා හිනා | නරි බෑණා<br>කැළණි පාලම<br>බෙරහඬ<br>හුණුවටයේ කතාව | The Rivals<br>Arms and the Man<br>Peace and Quiet<br>Right you are |

(28) විශ්ව විද්‍යාලයේ සිංහල සමිතිය මගින් රඟ දැක් වූ නාට්‍ය අයත් වන්නේ
(i) P (ii) Q (iii) R (iv) S

(29) "සිංහල ගැමි නාටකය" නම් ග්‍රන්ථය රචනා කළ නාට්‍යකරුවාගේ නාට්‍ය අයත් කාණ්ඩය වනුයේ,
(i) P (ii) Q (iii) R (iv) S

(30) 1960 සහ 1970 දශකයන්හි නිර්මාණය වූ නාට්‍ය අයත් වනුයේ
(i) P (ii) Q (iii) R (iv) S

(31) "S" තීරුවේ නාට්‍ය නිෂ්පාදනය සඳහා මුල් වූ ශිල්පියා වනුයේ,
(i) ඊ.එෆ්. සී. ලුඩෝවයික් (ii) හෙන්රි ජයසේන
(iii) එදිරිවීර සරත්චන්ද්‍ර (iv) ආචාර්ය මලලසේකර

(32) 2017 ''ජාතික නාට්‍ය උළෙල'' වැඩිම සම්මාන දිනාගත් නාට්‍ය වනුයේ,
(i) රජා මං වහලා
(ii) නැතුව බැරි මිනිහෙක්
(iii) මීයො නැතුව බෑ
(iv) දෙයියෝ සාක්කි

(33) නළුවකු තම පෞද්ගලිකත්වය අතහැර වෙනත් භූමිකාවකට ප්‍රවේශ වීම
(i) අංග රචනය වේ. (ii) අභිනය වේ. (iii) සමාරෝපය වේ. (iv) ක්ෂණික නිරූපණ වේ.

(34) සොකරි, නාඩගම්, නූර්ති රඟ දක්වන ලද රංග භූමි පිළිවෙලින් අයත් වරණය වනුයේ,
(i) කමත, කරලිය, ප්‍රොසීනියම් වේදිකාව
(ii) සබය, කමත, ප්‍රොසීනියම් වේදිකාව
(iii) කමත, කරලිය, සබය
(iv) සබය, කැරකෙන වේදිකාව, නූතන වේදිකාව

- **එක්තරා සංස්කෘතික උත්සවයක නියමිත අංග පෙළගස්වා තිබූ ආකාරය පහත දැක්වේ. ඒ ඇසුරෙන් 35 - 37 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A. වෙස් නැටුම
B. වඩිග පටුන
C. සළු පාලිය
D. කුළු නැටුම
E. ජස ලෙංචිනා කෝලම
F. තෙල්මෙ නැටුම
G. සොකරි නාට්‍ය ජවනිකාවක්
H. නූතන නාට්‍ය ගී

(35) නෘත්ත අංග පමණක් අයත් වනුයේ,
(i) A, B හා D (ii) A, D හා F (iii) E, F හා G (iv) D, F හා H

(36) මෙම සංස්කෘතික උත්සවයේ සෑම චරිතයක්ම වෙස් මුහුණු පළඳිනු ලබන අංග වනුයේ
(i) B හා G (ii) C හා G (iii) E හා G (iv) C හා E

(37) ඉහත අංග අතුරින් පහතරට ප්‍රදේශයන්ට ආවේණිකව ඉදිරිපත් කරන ලද නිර්මාණ වනුයේ,
(i) B, C, E හා F (ii) B, D, E හා G (iii) B, E, F හා G (iv) A, B, C හා D

(38) ශ්‍රී ලංකාවේ මුලින්ම නිශ්චිත පෙළක් සහිතව ඉදිරිපත් වූ නාට්‍ය සම්ප්‍රදාය වනුයේ,
(i) සන්නි යකුම් යාගයේදී ය.
(ii) සොකරි නාට්‍යයේ ය.
(iii) නාඩගම් ය.
(iv) නූර්තිහි ය.

(39) මෙම ඡායාරූපයෙන් දැක්වෙන වෙස්මුහුණු දෙක පිළිවෙලින් සඳහන් වනුයේ,




(i) ජසයා කෝලම, මුදලි කෝලම
(ii) අණබෙර කෝලම, ගමයා
(iii) හෙංචප්පු, මුදලි කෝලම
(iv) අණබෙර කෝලම, මුදලි කෝලම

(40) මෙම වාද්‍ය භාණ්ඩ දෙක යොදාගත් ගැමි නාට්‍ය දෙක පිළිවෙලින් අඩංගු වනුයේ,




(i) නූර්ති සහ කෝලම්
(ii) නාඩගම් හා කෝලම්
(iii) සොකරි හා නූර්ති
(iv) සොකරි හා කෝලම්

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

### 11 ශ්‍රේණිය

### නාට්‍ය හා රංග කලාව - II පත්‍රය

**නම/විභාග අංකය :-** ........................................................................ **කාලය : පැය 02 යි.**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(1) දික්තල කාලගෝල නාට්‍ය ආශ්‍රයෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නාට්‍යයේ අධ්‍යක්ෂවරයාගේ නම කුමක්ද? (ලකුණු 2)

(ii) දික්තල කාලගෝල නාට්‍යයේ ඇතුලත් නාඩගම් ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 2)

(iii) මෙම නාට්‍යයේ ගඟ නිරූපණය කර ඇති අයුරු දක්වන්න. (ලකුණු 2)

(iv) මෙම නාට්‍යයෙහි පැමිණෙන පාත්‍රයින් සතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 2)

(v) කුමන උපායක් මගින් කාලගෝල දික්තලා විවාහ කරගනී ද? (ලකුණු 2)

(vi) කාලගෝල නාට්‍ය අවසානයේ ගත් තීරණය කුමක්ද? (ලකුණු 2)

(2) (i) නෘත්ත, නෘත්‍ය, නාට්‍ය සඳහා උදාහරණ එක බැගින් දක්වන්න. (ලකුණු 3)

(ii) නෘත්ත හා නෘත්‍ය හඳුන්වන්න. (ලකුණු 4)

(iii) වේදිකා නාට්‍යයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 05 ක් නම් කරන්න. (ලකුණු 5)

(3)



(i) මෙම ඡායාරූපයෙන් දැක්වෙන ශාන්තිකර්මය නම් කරන්න. (ලකුණු 3)

(ii) මෙම ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු 4 ක් ලියන්න. (ලකුණු 4)

(iii) මෙම රංග අවස්ථාව හා බැඳි නාට්‍යමය ලක්ෂණ 5 ක් විස්තර කරන්න. (ලකුණු 5)




(4) (i) ඉහත රංග භූමිය හඳුනාගෙන එහි A,B, හා C නම් කරන්න. (ලකුණු 3)

(ii) මෙම ගැමි නාටකයේ පැමිණෙන පාත්‍රයින් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

(iii) මෙම ගැමි නාටකයේ රංග ශෛලියේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 5 ක් ලියා දක්වන්න. (ලකුණු 5)

(5) (i) සිංහල නූර්ති රචකයින් තිදෙනෙකු හා ඔවුන්ගේ නාට්‍ය නිර්මාණය බැගින් දක්වන්න. (ලකුණු 3)

(ii) නූර්ති ලංකාවේ ආරම්භ වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 4)

(iii) දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට නූර්ති කලාව බලපෑ ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)

(6) (i) ජයලත් මනෝරත්න නාට්‍යවේදියා අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය නිර්මාණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(ii) ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමී නාට්‍යකරු නම් කර ඔහුගේ වීදි නාට්‍ය කණ්ඩායමේ නම සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගෙන් ලංකාවේ නාට්‍ය කලාවට සිදු වූ මෙහෙය විමසන්න. (ලකුණු 5)

(7) පහත සිදුවීම් පාදක කරගනිමින් වේදිකාවට උචිත නාට්‍යමය ගුණයෙන් පෝෂිත කෙටි නාට්‍යයක් රචනා කරන්න. රංග විධාන, සංවාද, අර්ථාන්විත හා නාටෝචිතව යොදා ගත යුතුය.

'' සොරකම ජීවන වෘත්තිය කරගත් සෝමදාස හා සිරිදාස විශාල පෙට්ටියක් සොරා ගනී. බරින් අධික මෙම පෙට්ටිය පාළු ස්ථානයකට ඔසවාගෙන යන ඔවුන් එය විවෘත කර බලයි. එහි තිබී ඔවුනට හමුවන්නේ ඔවුන් කිසිවිටෙකත් නොසිතූ දෙයකි''.

(i) නාටෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 4)

(ii) සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 8)